සැ. යු. - 2012.05.11 දින පළ වූ අංක 1,758 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,759 - 2012 මැයි මස 18 වැනි සිකුරාදා - 2012.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 674 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 675 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 676 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 677 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 682 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - (i) ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 පෙබරවාරි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බුලත්සිංහල ජනශක්ති මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 පෙබරවාරි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන හා පර්යේෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මැයි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - අනුරාධපුර**

රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම

මෙම මහාධිකරණ කලාපයට අයත් කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් මෝටර් වාහන විකිණීම සඳහා වන 2012.02.17 දිනැති ගැසට් නිවේදනය මගින් කැඳවනු ලැබූ මිල ගණන් මෙයින් අවලංගු කරන අතර නැවත මුද්‍රාතබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | නඩු අංකය | වාහනය | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු ගෙවන රු. ශ. | ආපසු නොගෙවන රු. ශ. |
|---|---|---|---|---|
| 01. | 77684 | 43-7056<br>ලේලන්ඩ් වර්ගයේ ලොරි රථය | 10,000.00 | 100.00 |
| 02. | 67497 | 41-1309<br>ඉසුසු ටිපර් වර්ගයේ ලොරි රථය | 5,000.00 | 100.00 |
| 03. | 82833 | 49-6404<br>රෝද හතර ට්‍රැක්ටර් රථය | 1,000.00 | 100.00 |
| 04. | ඒ 958/2000<br>(01/2001) | 68-1546 ටොයොටා<br>තට්ටුව සහිත ලොරි රථය | 5,000.00 | 100.00 |
| 05. | 59834 | 26-1601 ටාටා ලොරි රථය | 5,000.00 | 100.00 |

02. 2012.05.21 වැනි දින සිට 2012.06.07 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 1.00 දක්වා කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ඉහත සඳහන් වාහන පරීක්ෂා කර බැලිය හැක.

03. එක් එක් වාහනය සඳහා ඉහත දැක්වෙන පරිදි ආපසු නොගෙවන තැන්පත් මුදලක් කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය හෝ අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා, ලදුපත් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත්කර ලංසු ආකෘති පත්‍ර 2012.05.21 සිට 2012.06.07 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ ලබා ගත හැකි අතර එම කාලය තුළ දී ආපසු ගෙවන තැන්පත් මුදල අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලබාගන්නා ලදුපත ලංසු අයදුම් පතට ඇමිණිය යුතු ය.

04. 2012.02.17 වැනි දින ගැසට් පත්‍රයේ පලකළ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමට අනුව මේ වන විටත් මිළ ගණන් එවා ඇති ටෙන්ඩර්කරුවන් ආපසු නොගෙවන තැන්පතුව ගෙවා නැවත ලංසු ආකෘති පත්‍ර අනුරාධපුර මහාධිකරණය හෝ කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ විසින් ලබා ගත යුතු ය. එම ටෙන්ඩර්කරුවන් මීට පෙර ගෙවා ඇති ආපසු ගෙවන ඇප තැන්පතුව කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් ආපසු ලබා ගත හැකිය.

5. එක් එක් වාහනය සඳහා වෙන වෙන ම ලංසු ඉදිරිපත් කළ යුතු අතර ලංසු කොන්දේසි පරිදි සම්පූර්ණකර මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනු පිටපත වශයෙන් පිටපත් දෙකකින් සකස් කර එම පිටපත් වෙන වෙන ම කවරවල බහා මුද්‍රා තබා එහි මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු ය. එම මුල් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "මෝටර් වාහන සඳහා මිල ගණන්" ලෙස ද වාහනයේ අංකය ද සඳහන් කර 2012.06.08 වැනි දින දහවල් 12.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය,
අනුරාධපුර.

06. එදිනම ප. ව. 12.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

ආර්. එම්. පී. එස්. කේ. රත්නායක,
මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය - අනුරාධපුර.

2012 මැයි මස 02 වැනි දින,
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

05-397

# බඩු බාහිරාදිය විකිණීම්

## පොලිස් දෙපාර්තමේන්තුව - හලාවත කොට්ඨාසය

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසිය

පොලිස් දෙපාර්තමේන්තුවේ හලාවත කොට්ඨාසයට අයත් පොලිස් ස්ථාන සහ කාර්යාලවල පාවිච්චි කර ගර්හිත කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2012 මැයි මස 24 වැනි දින පැය 9.30 ට හලාවත පොලිස් අධිකාරි කාර්යාල පරිශ්‍රයේදී පැවැත්වේ.

2012 මැයි මස 23 වැනි දින පැය 1300 සිට පැය 1600 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි භූමියට ඇතුළුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුයි.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතුයි. වෙනත් ගෙවුම් ක්‍රම භාවිතා නොකෙරේ. (චෙක්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්)

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ 2012 මැයි මස 24 වැනි දින පැය 1600 පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වග කියනු නොලැබේ.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම සහ විශේෂ හේතුවක් මත වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම යන තීරණ වෙන්දේසි මණ්ඩල විසින් ගනු ලැබේ.

වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

ආර්. ඒ. ඩී. සී. කේ. රණසිංහ,
පොලිස් අධිකාරී,
පොලිස් අධිකාරි කාර්යාලය.

### පැරණි භාණ්ඩ ලේඛනය

| | | |
|---|---|---|
| 1. | දොරවල්වල යතුරු | 13 යි |
| 2. | ගිණි නිවන උපකරණ | 03 යි |
| 3. | ෆොටෝ කොපි යන්ත්‍ර | 02 යි |
| 4. | අඟල් 16 කල්දේරම් | 01 යි |
| 5. | අඟල් 08 කල්දේරම් | 04 යි |
| 6. | සාස්පාන් | 05 යි |
| 7. | පා පැදි | 33 යි |
| 8. | යකඩ අල්මාරි | 01 යි |
| 9. | රෝනියෝ යන්ත්‍ර | 01 යි |
| 10. | පා පැදි හුලංපොම්ප | 01 යි |
| 11. | විදුලි පංකා කුඩස්තල | 01 යි |
| 12. | ඇළුමිනියම් කලගෙඩි | 01 යි |
| 13. | වතුර ෆිල්ටර් | 14 යි |
| 14. | ලාච්චු කබඩ් | 02 යි |
| 15. | පිහිය | 11 යි |
| 16. | මන්නා පිහි | 01 යි |
| 17. | පොරෝතල | 06 යි |
| 18. | ඇළුමිනියම් ජෝගු | 09 යි |
| 19. | කපන කටු | 04 යි |
| 20. | අඬුමිටි | 08 යි |
| 21. | ප්‍රින්ටර් | 01 යි |
| 22. | රේක්ක කොටස් | 15 යි |
| 23. | පරිගණක | 02 යි |
| 24. | දොර යතුරු තහඩු | 02 යි |
| 25. | දොර සරනේරු | 06 යි |
| 26. | ජනෙල් සරනේරු | 03 යි |
| 27. | බාල්දි | 11 යි |
| 28. | යූ. පී. එස්. | 03 යි |
| 29. | ස්ටැබිලයිසර් | 01 යි |
| 30. | යකඩ පුටු කොටස් | 85 යි |
| 31. | විදුලි කේතල | 09 යි |
| 32. | වායු සමන යන්ත්‍ර කොටස් | 01 යි |
| 33. | යතුරු ලියන | 20 යි |
| 34. | සීලින් විදුලි පංකා | 17 යි |
| 35. | ෆැක්ස් යන්ත්‍ර | 05 යි |
| 36. | මේස විදුලි පංකා | 12 යි |
| 37. | ඉබි යතුරු | 07 යි |
| 38. | කුඩා කල්දේරම් | 02 යි |
| 39. | වතුර මෝටර් | 13 යි |
| 40. | උදළු තල | 04 යි |
| 41. | යකඩ ඇඳුම් කබඩ් | 26 යි |
| 42. | ඇළුමිනියම් මැටි කෝප්ප | 02 යි |
| 43. | ගැලුම් මිම් උපකරණ | 01 යි |
| 44. | පෙට්ටි කඩන යකඩ කූරු | 01 යි |
| 45. | යකඩ අවි රාක්ක | 01 යි |
| 46. | රූපවාහිනී යන්ත්‍ර | 06 යි |
| 47. | පා පැදි කොක්විල් | 01 යි |
| 48. | පා පැදි ඇක්සල් | 01 යි |
| 49. | පැට්‍රල් ලාම්පු | 01 යි |
| 50. | වාහන පරීක්ෂා කරන යකඩ කූරු | 04 යි |
| 51. | බැරියල් | 12 යි |
| 52. | සවල් | 02 යි |
| 53. | තහඩු කපන කතුරු | 01 යි |
| 54. | උල් කටු | 01 යි |
| 55. | හිරමන | 03 යි |
| 56. | තාච්චි | 03 යි |
| 57. | බිලියඩ් මේස කොටස් | 01 යි |
| 58. | ගෑස් කුකර් ලිප් | 02 යි |
| 59. | කේතල | 01 යි |
| 60. | ඇලවංගු | 09 යි |
| 61. | පා පැදි ස්ටෑන්ඩ් | 03 යි |
| 62. | පන්තෑරුම් | 01 යි |
| 63. | මල්ටිපොට් | 01 යි |
| 64. | ප්ලාස්ටික් වතුර ටැංකි | 01 යි |
| 65. | ටියුබ් ලයිට් සෙට් | 20 යි |
| 66. | හැලජන් ලාම්පු | 08 යි |
| 67. | පාපැදි ඩයිනමෝ | 02 යි |
| 68. | විදුලි පන්දම් | 02 යි |
| 69. | යකඩ ඇඳන් | 06 යි |

05-391

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

2012 ජූලි මස සිට 2013 ජුනි මස දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

2012 ජූලි මස 01 වැනි දින සිට 2013 ජුනි මස 30 වැනි දින දක්වා මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 2007 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ................................ දරන ................................ රා තැබෑරුම සඳහා" යනුවෙන් හා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2012.05.18 වැනි දින පෙ. ව. 10.00 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 2007 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2012.05.18 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2012.06.05 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. පී. රංගන ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2012 අප්‍රේල් මස 25 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම* | *ටෙන්ඩර් පත්‍රය භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2012.05.18 වැනි දින පෙ. ව. 10.00 | 1,000. 00 |
| 02. | කල්පිටිය | ඒත්තාල | රා | 2012.05.18 වැනි දින පෙ. ව. 10.00 | 1,000. 00 |

05-396

# රජයේ නොවන දැන්වීම්

## සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ජෝන් කීල්ස් ප්‍රොපර්ටිස් ජා - ඇල (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 76068
සංස්ථාගත කළ දිනය : 2011.12.15
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 130, ග්ලෙනි වීදිය, කොළඹ 02
සමාගමේ ලේකම් : කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ලේකම්වරුන්ගේ අණ පරිදි,

කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

05-447

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගම් නාමය : අල්ජාලි ඉන්ටර්නැෂනල් ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85687
ලියාපදිංචි ලිපිනය : අංක 720, 2 වැනි මහල, ගාලු පාර, කොළඹ 03.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

05-452

---

## දැන්වීමයි

මොහාන් ප්‍රසන්න නානායක්කාර සහ මහීෂි බන්ධුනී නානායක්කාර වන අප විසින් කොළඹ 07, රොස්මීඩ් පෙදෙස, අංක 78 හි පදිංචි පුෂ්පා රංජනී අමරතුංග යන අයට දී තිබූ සී. ජේ. ද එස් අමරතුංග නොතාරිස් තැන විසින් සහතික කරන ලද වර්ෂ 2011 ජනවාරි මස 08 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය අද පටන් බලරහිත ප්‍රත්‍යාදිෂ්ඨ සහ නිෂ්ප්‍රභා කරන බව මෙයින් දැනුම් දෙමු.

05-382

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ගානට් හවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 අප්‍රේල් මස 05 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ගානට් හවුස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85 381
ලියාපදිංචි ලිපිනය : අංක 39/14, අංගම්පිටිය පාර, ඇතුල් කෝට්ටේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8244495/077-8197041.

05-387

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව එක්විල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 මාර්තු මස 26 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : එක්විල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85 120
ලියාපදිංචි ලිපිනය : අංක 10/16, මාකොළ පාර, උඩුපිල, දෙල්ගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කමල් එම්. ගමගේ,
ප්‍රවර්ධක.

දුරකථන අංක : 071-8244495/077-8197041.

05-388

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : සම්පත් සුපර් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 83786
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 30, යට්ටෝවිට පාර, පන්තිය, මතුගම
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.01.19

05-389/1

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ෆෙරියන් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 85009
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 07, ගාලු මුවදොර අධිකරණය-02, කොළඹ 02
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.03.20

05-389/2

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ඉකොන් ෆ්‍රෙයිට් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 83502
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 48, දේවාල පාර, පාගොඩ, නුගේගොඩ
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.01.20

05-389/3

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ත්‍රිකුණාමලය, ලව් පාර යන ස්ථානයෙහි පදිංචි පත්මනාදන් පත්මාවතී වන මා විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කොළඹ 13, ශ්‍රී කදිරේසන් පාර, අංක 154/7 හි පදිංචි සින්නය්යා සිවකුමාර් ජා. හැ. අ. 692312384 V පත්කරමින් ප්‍රදානය කරනු ලැබුවාවූ ද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මොහමඩ් යාකුබ් මොහමඩ් සඩුර්ඩීන් විසින් සහතික කරනු ලැබුවා වූ ද, වර්ෂ 2007 ක් වූ අගෝස්තු මස 28 වැනි දිනැති අංක 496 දරන ඇටෝර්නි බලපත්‍රය 2012.05.01 අද දින සිට මෙයින් අවලංගු කොට ශුන්‍ය කොට නිශ්ප්‍රභා කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

අංක 496 දරන එකී ඇටෝර්නි බලපත්‍රය මගින් පවරනු ලැබූ බලය යටතේ එකී සින්නය්යා සිවකුමාර් විසින් කරන ලද ක්‍රියාවන් සහ සියලු දේ නිෂ්ප්‍රභා සහ ශුන්‍ය මෙන් ම එහි බලයක් හෝ වලංගුතාවයක් නොමැත.

පත්මනාදන් පත්මාවතී.

05-407

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ 2010 මැයි මස 07 වැනි දින සණස සිකියුරිටි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ස්ථාපිත කළ වගයි.

සමාගමේ අංකය : පී වී 72226
ලියාපදිංචි කාර්යාලය : අංක 12, එඩ්මන්ටන් පාර, කොළඹ 6

මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-406

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ 2009 පෙබරවාරි මස 26 වැනි දින එස්ඩීඑල් නෝර්ත් ඊස්ට් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් ස්ථාපිත කළ වගයි.

සමාගමේ අංකය : පී වී 67143
ලියාපදිංචි කාර්යාලය : අංක 340 2/1, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-405

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 (34) වගන්තියට අනුගාමීව 2012 අප්‍රේල් මස 03 වැනි දින සේව් ද එලිෆන්ට් ලංකා (ගරන්ටි) ලිමිටඩ් ආයතනය සංස්ථාගත කළ බවට මේ මගින් දැනුම් දෙනු ලැබේ.

ආයතනයෙහි නම : සේව් ද එලිෆන්ට් ලංකා (ගරන්ටි) ලිමිටඩ්,
සමාගමේ අංකය : ජී. එල්. 2187,
ලිපිනය : අංක 28/21, වැවතැන්න පාර, ග්‍රීන්වැලි, අම්පිටිය, මහනුවර.

අණපරිදි

අධ්‍යක්ෂකවරු.

05-404

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදි.

සමාගමේ නම : ප්‍රෝපැප් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 84535,
සංස්ථාගත කළ දිනය : 2012 පෙබරවාරි මස 27
ලියාපදිංචි කාර්යාලය : අංක 10/1, ස්ටේෂන් පටුමග, උඩහමුල්ල, නුගේගොඩ.

අධ්‍යක්ෂක.

05-403

---

### ජෝර්ජ් ස්ටුවර්ට් හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ්

පෙර ජෝර්ජ් ස්ටුවර්ට් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සමාගමෙහි ලියාපදිංචි අංකය : පී බී 303 පී වී**

***සමාගමෙහි නම වෙනස් කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි***

පූර්ව ජෝර්ජ් ස්ටුවර්ට් ඒජන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2012 අප්‍රේල් මස 23 වැනි දා සිට බලපවත්වන පරිදි, 2007 අංක 07 සමාගම් පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව, ජෝර්ජ් ස්ටුවර්ට් හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කළ බව 9 (2) වගන්තිය ප්‍රකාරව, දැනුම් දෙනු ලබයි.

සමාගමෙහි ලියාපදිංචි අංකය : පී බී 303 පී වී
ලියාපදිංචි ලිපිනය : ස්ටුවර්ට් හවුස්, අංක 45, ජනාධිපති මාවත, කොළඹ 01

ජෝර්ජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්,
(සමාගම වෙනුවෙන් වූ සමාගම් ලේකම්වරු)

ස්ටුවර්ට් හවුස්,
අංක 45, ජනාධිපති මාවත,
කොළඹ 01.

05-415

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඩබ්ලිව්. එල්. ඒ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2010 නොවැම්බර් මස 03 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඩබ්ලිව් එල්. ඒ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 75307
ලියාපදිංචි ලිපිනය : අංක 36, නිව් සිටි ගාර්ඩ්න්, ගැටබුවාන, පිළියන්දල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

05-411

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පර්සිල් කෙමිකල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 අප්‍රේල් මස 01 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : පර්සිල් කෙමිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 78142
ලියාපදිංචි ලිපිනය : අංක 66, ශාන්ත අන්තෝනි මාවත, කඩලාන, මොරටුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

05-410

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව වින්සම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 අප්‍රේල් මස 09 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : වින්සම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85321
ලියාපදිංචි ලිපිනය : අංක 157, මොඩ්ල් ෆාර්ම් පාර, කොළඹ 08.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

05-409

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 අගෝස්තු මස පළමු වන දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ග්‍රීන් සෝන් ඉන්ස්ටෘමන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65041
ලියාපදිංචි ලිපිනය : අංක 158/3 දුනුවිල පාර, අකුරණ, මහනුවර

එම්. එම්. එම්. නව්ෂාඩ්.

05-517

---

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : ක්යූබා (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2012 අප්‍රේල් 18
3. සමාගමේ අංකය : පී වී 85523
4. ලියාපදිංචි ලිපිනය : අංක 79 බී, දේවාල පාර, නුගේගොඩ.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

05- 515

---

### ඩිෂ් ටී වී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීම

2012 අප්‍රේල් මස 25 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 85639 යටතේ ඩිෂ් ටී වී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 181/1/1, තිඹිරිගස්යාය පාර, කොළඹ 05 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

එම්. ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වැනි තලය),
අංක 2 ඩීල් පෙදෙස,
කොළඹ 03.

05-512

---

### සීමිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය

හේකෙම් (ප්‍රයිවට්) ලිමිටඩ්

(සමාගම් අංක පී බී 738 පීවී)

සහ

හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩිංස් ලිමිටඩ්
(සමාගම් අංක පී බී 575)

හේකෙම් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පි බී 738 පී වී) සහ හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩිංස් ලිමිටඩ් (සමාගම් අංක පී බී 575) යන සමාගම් ද්විත්වය 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242(3) බී වන ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩිංස් ලිමිටඩ් වන අතර මෙම ඒකාබද්ධය බල ගැන්වෙනු ලබන්නේ 2012 මැයි මස 31 වැනිදා හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල්වරයා විසින් අනුමත කරන දිනයක දී විය හැක.

ඒකාබද්ධවීමෙන් පසු හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩිංස් ලිමිටඩ් සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 පිහිටුවනු ලැබේ.

ඒකාබද්ධ කරනු ලබන සමාගමේ යම් කොටස් හිමියකු, ණය හිමියකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගම සමග බැඳීමකට යටත්ව ඇති යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ යෝජනාවේ පිටපත් ඒකාබද්ධ සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය වන අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 වෙතින් සේවා කාලයන් තුළ දී නොමිලේ ලබා ගත හැක.

ඒකාබද්ධ වන සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2012 අප්‍රේල් 26 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

05-510

**පොදු නිවේදනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 ජේදය ප්‍රකාර ඒකාබද්ධ කිරීම

ද යුනයිටඩ් සිලෝන් ඉන්ෂුවරන්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්

(සමාගම් අංක පී බී 1026 පී වී)

ඇලුටෙක් අනොඩයිසින් ඇන්ඩ් මැෂින් ටූල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(සමාගම් අංක පී වී 539)

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 ජේදයේ නියමයන්ට අනුකූලව ද යුනයිටඩ් සිලෝන් ඉන්ෂුවරන්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමටඩ් (සමාගම් අංක පී බී 1026 පී වී) සහ ඇලුටෙක් අනොඩයිසින් ඇන්ඩ් මැෂින් ටූල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පී වී 539) යන සමාගම් ද්විත්වය එක සමාගමක් ලෙස ඒකාබද්ධ කරන ලද බව සමාගම් පනතේ 244 (3) ජේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ සමාගමේ නාමය ඇලුටෙක් අනොඩයිසින් ඇන්ඩ් මැෂින් ටූල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අතර, එකී ඒකාබද්ධ කිරීම සමාගම් පනතේ, නියමයන්ට අනුකූලව සම්පූර්ණ කර ඇත. ඒ අනුව සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල් විසින් 2012 මාර්තු මස 22 වැනි දින සමාගම් පනතේ 244 (1) (අ) යටතේ ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2012 මාර්තු මස 26 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

05-509

---

**සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීමේ පොදු නිවේදනය**

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 ජේදයේ නියමයන්ට අනුකූලව "එක්ස්පලොජික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" 2012 මාර්තු මස 22 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නාමය : එක්ස්පලොජික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 84960
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සංස්ථාගත කළ දිනය : 2012 මාර්තු 22 වැනි දින

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2012 මාර්තු මස 30 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

05-508

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සණස මීඩියා නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2012 ක් වූ අප්‍රේල් මස 17 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සණස මීඩියා නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85515
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

05-500

---

**මහජනතාව වෙත කෙරෙන දැනුම්දීමයි**

සුරාඩෝ කැම්පස් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : සුරාඩෝ කැම්පස් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 130/ඒ, ගාලු පාර, දෙහිවල
ලියාපදිංචි කළ දිනය හා අංකය : 2012 පෙබරවාරි මස 29 වැනි දින , පීවී 84584

අධ්‍යක්ෂකවරු.

1. පොල්වත්ත සිරියලාගේ රචිත බුද්ධික
2. ප්‍රසාද් සුමින්ද කළුආරච්චි
3. හෙන්නායක මුදියන්සේලාගේ ලුවිරංග පමුදිත බංඩාර හෙන්නායක.

අධ්‍යක්ෂකවරු.

05-499

---

**JUNG YOON TEXTILES (PRIVATE) LIMITED**

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 7104

**අවසන් මහ සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 331(2) වගන්තිය යටතේ සැහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන මහ සභා රැස්වීම 2012 ජුනි මස 29 වැනි දින පස්වරු 4.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි පිහිටි එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් ආයතනයේ රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඇවරකිරීමේ කටයුතු සිදු කළ ආකාරය,
2. සමාගමේ වත්කම් උපලබ්දි කළ ආකාරය, සහ
3. ආදල අනෙකුත් විස්තර ලබාදීම සම්බන්ධයෙන්.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
Jung Yoon Textiles (Pvt) Ltd.
ඈවරකරුවන්.

2012 මැයි මස 04 වැනි දින.

05-498

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සෙරීනා හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 84546
ලියාපදිංචි අංකය : 197/6 ඒ, කොළඹ පාර, වේරහැර, බොරලැස්ගමුව
සංස්ථාපන දිනය : 27.02.2012.

සමාගම් ලේකම්.

05-492

---

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ඩෙසර්ට් ඇන්ඩ් සී හොරයිසන් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83028
සංස්ථාගත කිරීමේ දිනය : 2011 දෙසැම්බර් 15
ලියාපදිංචි කාර්යාලය : අංක 6 බී 1/1, කස්සප පාර, කොළඹ 05.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

05-484/1

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කළ බවට කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනය.

සමාගමේ නම : කේ. එම්. එල්. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 84902
සංස්ථාගත කළ දිනය : 2012 මාර්තු 15 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 52, කිරුළපොන මාවත, කොළඹ 05.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

05-484/2

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි.

01. සංස්ථාගත කළ දිනය : 2012 අප්‍රේල් මස 03 වැනි දින
02. සමාගමේ නම : බෙලිවික් ඇග්‍රෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
03. සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 85302
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 2/184, ෆාම් වත්ත, පලාතොට පාර, කලුතර දකුණ

කේ. වයි. ඇසෝසියේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

05-479

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කහවත්ත, ඇල්ලගෙවත්ත, හි පදිංචිව සිටි දැනට දකුණු කොරියාව, සැම්සෝල් කම්පැනි ලිමිටඩ් 510/S හි පදිංචි ලියනගේ සමන් පුෂ්පකුමාර වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ජයසිරි විසින් 2011.08.18 දින ලියා සහතික කරන ලද අංක 7505 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද කහවත්ත, ඇල්ලගෙවත්ත, අංක 26 හි පදිංචි ලියනගේ ස්වර්ණා ධම්මිකා ලියනගේ (ජා. හැ. අ. 658591461V) යන අයගේ පත්වීම 2012.04.10 වැනි දින සිට අවලංගු කොට බල රහිත කරන ලද බවට ශ්‍රී ලංකාවාසී සැමට මෙයින් දන්වා සිටිමි.

05-401

---

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

සමාගමේ නම : පැන් ඔරියෙන්ටල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV85569
සංස්ථාගත කිරීමේ දිනය : 2012 අප්‍රේල් මස 20 වැනි දින
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 17/9, එච් ලා කෘෂ්ටානි 7 වැනි පටුමග, ඥානේන්ද්‍ර මාවතින් හැරී නාවල.

අධ්‍යක්ෂ.

05-400

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගාල්ල, කනම්පිටිය පාර, අංක 37ඒ හි පදිංචි මොහමඩ් මොහමඩ් අජිසල් වන මවිසින් ගාල්ල, කනම්පිටිය පාර, අංක 37ඒ හි පදිංචි මොහමඩ් සාලී මොහමඩ් ෂම්ස් මාගේ ඇටෝර්නි බලකරු කරමින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වන එස්. සී. සී. ආර්. කුලතිලක යන අය විසින් වර්ෂ 2003.10.15 දින ලියා සහතික කරන ලද අංක 8230 දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2012 ක් වූ මැයි මස 01 වැනි දින සිට අවලංගු කරන බැව් මෙමගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට හා මහජනතාවට දන්වා සිටිමි.

තවද ඉහත කී ඇටෝර්නි බලකරු වන මොහමඩ් සාලී මොහමඩ් ෂම්ස් යන අය විසින් මා වෙත හෝ මා වෙනුවෙන් කරන ලද කිසිම ක්‍රියාවකට වර්ෂ 2012 ක් වූ මැයි මස 01 වැනි දිනෙන් පසුව මවිසින් වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

මොහමඩ් මොහමඩ් අජිසල්.

05-383

**ප්‍රසිද්ධ නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වෙනි වගන්තිය යටතේ සමාගම පහත පරිදි සංස්ථාගත කිරීම මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : ආකාෂ් ටී (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි සමාගමේ අංකය : පීවී 77834
දිනය : 2011.03.17
ලියාපදිංචි ලිපිනය : අංක 83 ඒ, බලගල පාර, හැඳල, වත්තල.

අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලීම පරිදි,

එස්. ඩී. ජී. ටී. කුලතුංග,
ලේකම්.

දුරකථන අංකය : 0114959838.

05-384

**මහජන දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ජී. ඒ. කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2009 දෙසැම්බර් මස 02 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ජීඒ කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 70194
ලියාපදිංචි ලිපිනය : අංක 16 8/8, වේවැල්දූව, දලුගම, කැළණිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මා.ග.ක.ව. කුමාර,
ලේකම්.

දුරකථන අංක : 071-8244495/077-8197041

05-386

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : ඉන්ෆිනිටි බීච් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 85438
ලියාපදිංචි කළ දිනය : 2012.04.09
කාර්යාල ලිපිනය : අංක 220/1, ටොරින්ටන් පටුමග, කොළඹ 07.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

05-438

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - කළුතර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීමයි

මෙම දේපළ මෙසස් සන්දීප බන්දුල ට්‍රාන්ස්පෝටර්ස් ඇන්ඩ් ඉන්ජිනියරිං ප්‍රයිවට් ලිමිටඩ් සහ දකුණු කළුතර පදිංචි මදුරගේ උපාලි දිසානායක, මදුරගේ දොන් අනුර දිසානායක, මදුරගේ නිමල් චන්ද්‍රා දිසානායක සහ මදුරගේ මාලනී දිසානායක යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර පලාතොට පිහිටි රූඩ් 01 පර්චස් 18.2 (අ. 0 රූඩ් 1 පර්. 18.2) නොහොත් හෙක්ටයාර් 0.1471 කින් යුතු නිවසක් ද සහිත වටිනා දේපලක් එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2012 ජූනි මස 12 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කළුතර ඔරලෝසු කණුව මංසන්ධියේ සිට පලාතොට පාරේ කි. මී. 1.6ක් පමණ ගිය විට දකුණු පසට ඇති ප්‍රාදේශීය සභාවට අයත් පාරට හැරී තවත් මීටර් 30ක් පමණ ඉදිරියට ගිය විට වම්පසට ඇති දේපළට පිවිසීම සඳහා ඇති පාරේ මීටර් 50ක් පමණ ගිය විට අදාළ දේපළ පාරේ දකුණු පස පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම*.- රජයේ ගැසට් පත්‍රයේ 2009.12.11 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.12.02 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2009.12.29 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.:-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500.

සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456472, 2456487.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.

දුරකථන අංක : 011-3068185, 011- 2572940.

05-478

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ඩෙවලප්මන්ට් බෑන්කිං යුනිට් ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ මොරටුව පදිංචි සමරකෝන් මුදියන්සේලාගේ අසංක ශ්‍රීනාත් සහ ලියනරාලලාගේ නන්දාවතී යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ කෙසෙල්වත්ත, වරිපනම් අංක 12/8 ඥාණවිමල පටුමග, හොරේතුඩුව ගමේ පිහිටි පර්චස් 6.12 (අ. 0 රූ. 0 පර්. 6.12) ක් විශාල ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2012 ජූනි මස 12 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- කොළඹ සිට ගාලු පාර ඔස්සේ (පැරණි ගාලු පාර) මොරටුව දුම්රිය ස්ථාන මංසන්ධිය දක්වා ගොස් තවත් මීටර් 400ක් පමණ ගිය විට (පැරණි පාරේ) ඇති දිගරොල්ල පාලම ද පසුකළ විට ඇති ඉන්ධන පිරවුම්හල ද පසුකර මීටර් 200ක් පමණ ගිය විට වම්පස ඉන්ධන පිරවුම්හල අසලින් ඇති ඥාණවිමල මාවතට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 250ක් පමණ ගිය විට දකුණුපසට ඇති ඥාණවිමල පටුමගට හැරෙන්න. ඥාණවිමල පටුමගේ තවත් මීටර් 150ක් පමණ ගියවිට වම්පසට ඇති අඩි 20ක් පළල ඇති මාර්ගයට හැරුණු විගසම අදාළ දේපළට පිවිසෙන මාර්ගය හමුවේ. එම මාර්ගයේ මීටර් 150ක් පමණ ගිය විට මාර්ගයේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම*. - *රජයේ ගැසට් පත්‍රයේ* 2010.08.20 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.08.21 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2010.08.18 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු යː-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500.

සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456472, 2456487.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.

දුරකථන අංක : 011-3068185, 011- 2572940.

05-477

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ බත්තරමුල්ල ව්‍යාපාර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 22183 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන වේ මාස්ටර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් දෙදෙනාම බත්තරමුල්ල පදිංචි හංගිඩි ගෙදර කුවින්ටස් ආරියරත්න සහ වින්ධ්‍යා නිලක්ෂි රූපසිංහ යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වැනි වෙන්දේසිය :-*

කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල පාර බත්තරමුල්ල, වරිපනම් අංක 97/9 සහ 97/10 දරන (නව අංක 97/16 සහ 97/17) පර්චස් අටයි දශම නවයයි හයක් (අ. 0 රූ. 0 පර්. 8.96) විශාල එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2012 ජුනි මස 08 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*2 වැනි වෙන්දේසිය .-*

කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල පාර, බත්තරමුල්ල වරිපනම් අංක 97/5 දරන පර්චස් දහයයි දශම නවයයි පහක් (අ. 0 රූ. 0 පර්. 10.95) විශාල එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියලු දේ සමග ඉඩම.

බලයලත් මිනින්දෝරු ඩී. ඒ. එන්. යාපා විසින් සාදන ලද 1975.07.04 දිනැති අංක 372/සීඑච්/ඩී/1/685/810 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 4, 5 සහ 10 තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග (බලයලත් මිනින්දෝරු එච්. ඒ. පීරිස් විසින් වලංගු කරන ලද 1977.09.24 දිනැති අංක 2150 දරන සැලැස්මේ ලොට් 4 ලෙස නිරූපනය වන).

ඉහත සඳහන් දේපළ 2012 ජුනි මස 08 වැනි දින පෙරවරු 10.45 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* බත්තරමුල්ල ප්‍රධාන බස් නැවතුම්පළේ සිට කඩුවෙල පාර ඔස්සේ යාර 100ක් පමණ ඉදිරියට ගිය විට වම්පසට ඇති ලෙනාර්ඩ් පෙරේරා මාවතට හැරෙන්න. එම මාර්ගය ඔස්සේ තවත් යාර 100ක් පමණ ඉදිරියට ගිය විට අදාළ දේපළ දෙක පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම. -* රජයේ ගැසට් පත්‍රයේ 2012.03.02 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2012.02.23 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2012.02.21 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය. -* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500.

සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456482, 2456487.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු)
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011- 2572940.

05-476

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය (සංශෝධිත) 2011 අංක 01 දරන විශේෂ විධිවිධාන පනත යටතේ විකිණීම

**ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපළක් වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුව තුළ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල පිහිටි තක්සේරු අංක 530/13 දරන මීගමුව පාර, "කැන්දගහවත්ත මදටියගහ කුඹුර (ඕවිට) හෙවත් මදටියගහ කුඹුර" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 1993.07.03 දිනැති අංක 3089 දරන පිඹුරේ පර්චස් 8.3ක විශාලත්වයක් ඇති ලොට් අංක 6 වන බිම් කට්ටියට අදාළ වටිනා දේපළ වෙන්දේසිය.

*දේපළ විස්තරය .-* බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුව තුළ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල පිහිටි, තක්සේරු අංක 530/13 දරන මීගමු පාර, "කැන්දගහවත්ත මදටියගහ කුඹුර (ඕවිට) හෙවත් මදටියගහ කුඹුර" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 1993.07.03 දිනැති අංක 3089 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කළ බිම් කට්ටිය වන පර්චස් අටයි දශම තුනක (අක්. 0 රූඩ් 0 පර්. 8.3ක) විශාලත්වයක් ඇති ලොට් අංක 06 නමැති ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ ම පිහිටි ලොට් අංක 3 හා 5 ද, නැගෙනහිරට : ජල මාර්ගය ද දකුණට : ජේ. එන්. ජයනෙත්තිට අයත් ඉඩම ද, බටහිරට : එම ඉඩමේ ම පිහිටි ලොට් අංක 7 ද යන මායිම් ඇතුළත පිහිටි ඉඩම හා ගස් වගාවන් සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 1004/166 යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද, මෙකී දේපළට ඇතුළුවීම සඳහා ඉහත සඳහන් අංක 3089 දරන පිඹුරේ ලොට් අංක 3 දරන අඩි 10ක් පළල මාර්ගයේ සහ සිරි ලියනසූරිය බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 530 දරන 1972.01.29 දිනැති පිඹුරේ දැක්වෙන ලොට් අංක 6 හා ලොට් ඒ2 කැබලි වල මාර්ග අයිතිය ද සමග වේ.

මෙම දේපළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට උකස් තබා ඇත්තේ, අංක 123/1, වනවාසල පාර, කැළණිය පදිංචි සුබ්‍රමානියම් මනිමරන් මහතා සහ ඉගල ආරච්චිලාගේ දොන් ඉනෝකා දිනාලි නානායක්කාර මහත්මිය විසිනි. කේ. පලිහක්කාර නොතාරිස්තැනගේ 2008.08.06 දිනැති අංක 8228 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුවේ උකසට තබා ඇත.

*දේපළට ලඟාවීම. -* කොළඹ සිට පැලියගොඩ බුදු පිළිමය හන්දිය දක්වා යා යුතු ය. එතැන් සිට මීගමුව පාරේ කිලෝමීටර් 3.8 ක් පමණ ගොස් වත්තල ඔරලෝසු කණුව ද පසුකර, එම පාරේ ම මීටර් 425ක් පමණ යන විට රේන්බෝ රෙස්ටුරන්ට් හමුවේ. එම රෙස්ටුරන්ට් එක පසුවනවාත් සමගම දකුණට ඇති තාර සහ කොන්ක්‍රීට් පාර දිගේ මීටර් 100ක් පමණ ගොස් නැවත දකුණට හැරී මීටර් 25ක් පමණ යන විට වමට ඇති මාර්ග රක්ෂිතයේ මීටර් 5ක් පමණ දුරින්, එම පාරේ ම දකුණු පස මෙම දේපළ පිහිටා ඇත.

මෙම දේපළ අප විසින් 2012 ජුනි මස 07 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී, ඊට අයත් සියලු දේ සමග ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය. -* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතු යඃ-

1. ගැණුම් මිලෙන් 25%,
2. ගැනුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතු ය,
3. ගැණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක ප්‍රතිශතයක්) වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතු ය.
4. සම්පූර්ණ ප්‍රචාරක ගාස්තු වියදම රු. 117,050,
5. ලිපිකරුගේ හා සෝෂකකරුගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි ගාස්තුව වශයෙන් රු. 3,000ක් ගෙවිය යුතු ය.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% ක මුදල, වෙන්දේසි දින සිට දින 30ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතු ය. වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා, සහකාර සාමාන්‍යාධිකාරී (ණය), ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 2576132.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*අගනුවර කාර්යාලය :*
අංක 290 හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011 2585408,
ෆැක්ස් අංකය : 011 2588176,
ඊමේල් : schokman@samera1892.com

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරිංටන් පාර, නුවර.
දුරකථන අංකය 081 - 2227593,
ෆැක්ස් අංකය : 081- 2224371 ,
ඊමේල් : schokmankandy@sltnet.lk

05-482

---

**හැටන් නැෂනල් බැන්ක් - පීඑල්සී කොල්ලුපිටිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී එල් සී නමට ලියා සහතික කරන ලද අංක 3263 සහ 2007.06.08 දින දරන ණය බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් නිශාන්ත සපුමල් හපුආරච්චි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2012 ක් වූ ජුනි මස 20 වැනි දින ප. ව. 2.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ, ඹියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෙයියනතුඩුවේ පිහිටි ගලබඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. එන්. ප්‍රනාන්දු මහතා විසින් 2006.06.27 වැනි දින මැන සාදන ලද අංක 3016 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 3 ඒ දරන කොටස.

විශාලත්වය : අ 0, රූ. 0, පර්. 6.10

*වැඩිදුර විස්තර සඳහා* .- 2009.03.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2009.09.10 වැනි දින දී අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම* .- කිරිබත්ගොඩ මංසන්දියේ සිට සපුගස්කන්ද දෙසට පැමිණීමේ දී හමුවන මාකොළ නගරයෙන් වම් පසට ඇති මාර්ගයේ මාවරමංඩිය දෙසට කි. මී. 2.4ක් පමණ දුර පැමිණෙන විට හමුවන ගල්වල හංදියෙන් දකුණට ඇති කඩුවෙල පාරේ සියඹලාපේ දෙසට තවත් මීටර් 400ක් පමණ ඉදිරියට පැමිණි පසු හමුවන දළුගල්ල පාරට පිවිස තවත් මීටර් 300ක් පමණ ඉදිරියට පැමිණ වම්පසට ඇති මාර්ගයේ මීටර් 100ක් පමණ ඉදිරියට පැමිණෙන විට පාරේ වම්පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් සිදුකළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

1. වෙන්දේසිය තීන්දු වූ විගස ගැණුම් මිලෙන් 10%ක මුදලක් ද,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක බදු මුදල ද,
3. ගැණුම් මිලෙන් 2 1/2%ක් වූ වෙන්දේසිකරුගේ කොමිස් මුදල ද,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. ප්‍රචාරක වියදම් ද.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට ද එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට ද බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂාකර බැලීමට හා වැඩි විස්තර දැන ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 011-2664664.

ශ්‍රීයාණි මනම්පේරි,
ප්‍රසිද්ධ වෙන්දේසිකරු, උසාවියේ කොමසාරිස්,
තක්සේරුකරු සහ බ්‍රෝකර්.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

දුරකථන අංක : 011 - 2320074 හෝ 0713 - 151356.

05-443

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.